# මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

# 2024/2025

# ජාතික අධ්‍යාපන ආයතනය

ජාතික අධ්‍යාපන ආයතනයේ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (SLQF - Level 3) හැදෑරීමට අපේක්ෂා කරන අයගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. මේ සඳහා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට ඉල්ලුම් කළ හැකි ය.

**සුදුසුකම්**

ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.

යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

2024.10.30 වන දිනට වයස අවුරුදු 45 ට අඩු වීම.

අ. පො. ස. (උ. පෙළ) විෂය 3කින් සමත් වීම.

**බඳවා ගැනීමේ ක්‍රමය**

සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගනු ලැබේ.

**පාඨමාලාවේ ස්වභාවය**

එක් අවුරුදු පාඨමාලාවකි.

**පාඨමාලා ගාස්තු හා ලියාපදිංචි ගාස්තු**

ලියාපදිංචි වීමේ දී රුපියල් 1000ක් ගෙවිය යුතු අතර පාඨමාලා ගාස්තුව වන රුපියල් 40,000ක මුදල වාරික තුනකින් ගෙවිය හැකි ය.

සතියේ දිනවල හා සති අන්තවල දේශන සහ ක්‍රියාකාරකම් පැවැත්වේ. අධ්‍යයන පැවරුම් හා ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුවකින් ද යුක්ත ය.

මෙම පාඨමාලාවට බඳවා ගනු ලබන්නේ සීමිත සංඛ්‍යාවක් පමණි. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් 2024.10.30 දිනට පෙර ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට පිවිස https://www.exams.nie.lk/intakes/new යොමුව ඔස්සේ මාර්ගගත ව පමණක් අයදුම්පත්‍ර යොමු කළ යුතු ය. මාර්ගගත ව අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් පහත යොමුව මගින් ලබාගත හැකි ය.
https://www.exams.nie.lk/info/applying-for-new-enrollments

මහාචාර්ය ප්‍රසාද් සේතුංග
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය.
www.nie.lk